# වෘත්තීය සමිති නායකයින්ගේ ඔළුව වැනීම.

මේ ගමන අවුරුද්ද වැඩ කරන ජනතාවටත් අනෙක් පීඩිතයින්ටත් විශාල බඩ කොරවෙන අවුරුද්දක් වෙලා. අලුත් අවුරුදු බෝනස් බලා හිටි හුඟ දෙනෙකුට අතේ පිච්චියක් නැතිව ගෙදර යන්න වෙලා. රජයේ සේවකයන්ටත් උද්ධමනය නිසා හුළං බැහැපු බෝනස් තමයි ගන්න වෙලා තියෙන්නේ. ඒ මදිවට සමහර ආයතනවල තවමත් වාර්ෂික පඩි වැඩිවීම ගෙවලත් නෑ.

අනෙක් අතට ජීවන අංකයට අනුව පඩි වැඩි වීමේ පොරොන්දු දැන් නිකම්ම බල්ලට දමල. රජ්‍ය අංශයේ නම් දැන් අවුරුද්දක ඉඳලම ජීවන අංක ගෙවීම් එක තැන පල්වෙන්න පටන් අරන්. ඇත්තටම ගණන බැළුවොත් අවම ජීවන අංක දීමනාවත් රුපියල් පන්දහසකට වඩා වැඩි විය යුතුයි.

ඒත් තවම සොච්චම් ගෙවීම්වත් හරියට කෙරිල නෑ. මේවා ගැන ඇහැව්වහම ආණ්ඩුව කියන්නේ යුද්ධයට යන වියදම අස්සේ ඕවා කතා කරන එක හරි නෑ කියන එකයි. ඒත් ලෝකයා ඉදිරියේ කියන්නේ යුද්ධය නොතකා ජනතාවගේ සියළු සංවර්ධනයන් කෙරීගෙන යන බවයි.

මේ කතාව අහගෙන වෘත්තීය සමිති නායකයොත් ඔළුව වනල එන එකයි කරන්නේ. ආණ්ඩුවට කෙළින්ම සම්බන්ධ නායකයෝ නම් කමක් නෑ. මහ ලොකුවට ස්වාධීන වමේ වෘත්තීය සමිති කියල පෙන්නපු රිදී පුත්‍රයෝ පමණක් නෙවෙයි, රත්න පුත්‍රයොත් මේ පන්දම් පෙළපාලියට එකතුවීමයි ලොකුම පුදුමය.

දැන් ආණ්ඩුව කම්කරු සටන්වලට මැර බලයෙන් මුහුණ දෙනව විතරක් නෙවෙයි, උසාවියත් හවුල් කරගන්නව. විවිධාකාර හේතු දක්වමින් හාම්පුතුන් වැඩවර්ජනවලට විරුද්ධව උසාවි ගියහම ඒ හේතු උඩ වැඩවර්ජන තහනම් කරන්නට උසාවි යොමු වෙලා තියෙනව.

නීති පොතේ තිබුණත් තම අයිතිවාසිකම් වෙනුවෙන් වැඩවර්ජනය කරන්නට අයිතිය තියෙනව කියල, දැන් උසාවිය කියන්නේ හැමෝටම එම අයිතිය නැති බවයි.

දැන් හාම්පුතුන්ට මේක ගජ පල්ලමක් වෙලා. ඔවුන් හිතෙන හිතෙන හැටියට උසාවි යනව වැඩවර්ජන හා පංති අරගල තහනම් කරන්නට.

මේක කම්කරුවන්ට හරියට ගහෙන් වැටුන මිනිහට ගොනා ඇන්න වගේ වැඩක්. අසාධාරණයට විරුද්ධව වැඩ කළහම ඉල්ලීම් ලැබෙනව වෙනුවට සිද්ධ වෙන්නේ හිර කූඩුවල ලගින්න.

රජයේ සේවකයින්ට දැන් විශාල වෛරයක් ඇති වෙලා තිබෙන්නේ අත්තිකාරම් කපා දැමීමටත් වඩා තමන්ට ලැබෙන්නට තිබෙන ණය පහසුකම් කපා දැමීමයි. අළුත් ආණ්ඩුව ආපු ගමන් කිව්වේ රජයේ සේවකයාට මේ වගේ සොච්චම් ණය මොකටද, ඒවා කිහිප ගුණයකින් වැඩි කරන්නට ජනාධිපති සූදානම් කියලයි.

එහෙම කියල අළුත් චක්‍රලේඛයක් එව්වා කිව්වා ණය ගැනීම් ආදිය ගැන. රජයේ සේවකයෝ මේ ණය ගැනීමට කට මැදගෙන හිටියේ. සමහරු ඉඩම්වලට මුදල් අත්තිකාරම් දීල, ගිවිසුම් අත්සන් කරල, ප්ලෑන් ගහල සූදානම් වුණා.

දැන් ඒ හුඟ දෙනෙක් අතරමං වෙලා. සමහරු දාපු සල්ලි ගන්න බැරුව ඉන්නව. තවත් සමහරු බාගෙට ගත්ත ඉඩම් කුණු කොල්ලෙට විකුණලා ළතැවෙනව.

මේ විදියට විශාල අමාරුවක රජයේ සේවකයෝ බොරු ණය පොරොන්දු නිසා අද වැටිල ඉන්නව. පුද්ගලික අංශයේ කම්කරුවන්ගේ සෑම ස්ථිර කම්කරුවෙක්ම ඉන්නේ මර බයෙන් කොයි වෙලේ තමන් දොට්ට වැටෙයිද කියල.

කම්කරු උසාවි ගියත් දැන් ලැබෙන්නේ සාධාරණ තීන්දු නෙවෙයි. රජයෙන් මෙන්ම ඉහළින් ලැබෙන මහපෙන්වීම් මගින් උසාවි දැන් අළුත් රේල්පීලිවලට දාල තියෙන්නේ.

සුළු සහන හා වන්දි මගින් සේවකයන් අස් කිරීමට අද හාම්පුතුන්ට ඉඩ ලැබිල තියෙනව. අනෙක් අතට ඒකාබද්ධ ගිවිසුම්වලින් ඉස්සෙල්ල සාධාරණ ලෙස සලකපු කොන්දේසි දත් කපල දමන්නටයි උත්සාහය තියෙන්නේ.

මේ ගැන කම්කරු කොමසාරිස් දෙපාර්තමින්තුවත් අළුත් ඇසකින් බලන්නට වෙලා. ජීවන අංක දීමනා, අස්වීමේ හා ඉවත් කිරීමේ කොන්දේසි ආදිය කප්පාදු කිරීමට හාම්පුතුන්ට ඉඩ ලබාදීමට කම්කරු දෙපාර්තමේන්තුවත් එදාට වඩා හාත්පසින් වෙනස් ලෙසට අද කටයුතු කරන බවයි වෘත්තීය සමිතිවලින් කියන්නේ.

අද මතුවෙලා තිබෙන මේ අළුත් තත්වය පිටුපස්සේ තිබෙන්නේ ආණ්ඩුවේ යුදවාදී ක්‍රියාමාර්ගයත්, ගෝලීය ධනපති ආර්ථික න්‍යාය පත්‍රයත්. බිලියන ගණන් විදේශ ණය අරගෙන ආණ්ඩුව අද ගමන් කරන්නේ බහුජාතික සමාගම් විසින් පංගනාර්තු කරපු පාර දිගේයි.

එතැනදි ඒ බලවතුන් කියන ලෙසට කම්කරු නීතිරීති වෙනස් කරන්නට ආණ්ඩුව එළිපිටත්, වක්‍රවත් ක්‍රියා කරනව. මේ ගැන කම්කරුවන් කැකෝ ගහන කොට, සටන් මහට පිවිසෙන කොට ආණ්ඩුව ඇදල ගන්නේ යුද්ධය පිළිබඳ කතාවයි.

දේශප්‍රේමී යුද්ධය වෙනුවෙන් කැප කළ යුතු බව ආණ්ඩුව කියනව. ඒ උඩ සටන් කඩාකප්පල් කිරීමට උසාවිය මගින්, නැත්නම් මැර බලයෙන්, එහෙමත් නැත්නම් කම්කරු නායකයින්ව හරවා ගැනීමෙන් කටයුතු යොදනව.

ලොකු එකා ලොකු මහත් වෙන, පොඩි එකා නැති භංග වෙන මේ ඊනියා සංවර්ධනයට ගන්නා ණය ගෙවීම සඳහා වැඩ කරන ජනතාව බිලි දීමට ආණ්ඩුව එක අතකින් ක්‍රියා කරනව.

අනෙක් අතට දෙමළ ජනතාවගේ සාධාරණ අයිතීන් නොදී ගෙන යන යුද්ධය සඳහා යන වියදම් මුළුමණින්ම වැඩ කරන ජනතාව මත පැටවීමත් කරගෙන යනව.

මේ ලෙසට බරපතල ලෙසට වැඩ කරන ජනතාවගේ ජීවන තත්වය පහළ දමමින් රැකියාවේ ආරක්ෂාව නැති කරමින් යන ගමන නැවැත්වීමට සමස්ථ සටනක් කළ යුතු බවයි එක්සත් කම්කරු සම්මේනයේ සභාපති ලීනස් ජයතිලක සහෝදරයා පවසන්නේ.

වැඩ කරන ජනතාවට සමස්ථ වශයෙන් මුහුණ දෙන්නට වන ජීවන කප්පාදුව බරපතල එකක්. එය කරන්නේ ආණ්ඩුවේ ජාතිවාදී යුදවාදී දේශපාලනයේ පිහිටන්.

එය ඉදිරියට දමාගෙන රජය ගෙනියන්නේ පරම්පරා ගණනාවක් දිනා ගත් අයිතීන් කප්පාදු කිරීමයි. විවෘත ආර්ථික ප්‍රතිපත්ති ගැන, පුද්ගලිකකරණය ගැන එක්සත් ජාතික පක්ෂයට බැණ අඩගසමින් ආණ්ඩුව එම ආර්ථික සැලසුමම ඉදිරියට ගෙන යනවා.

මේ අනුව මේ කප්පාදු සැලසුම්ලට පූර්ණ සහයෝගය ආණ්ඩුවට එක්සත් ජාතික පක්ෂයෙන් ලැබෙනව. රනිල් වළං පිහන් පොළොවේ ගහමින් බඩුමිල ගැන කතා කරන අතර කම්කරු නීති තද කිරීම, උසාවි මගින් තහංචි දැමීම ගැන උණුසුම් සුභපැතුම් හාම්පුතුන්ට ලබා දෙනව.

ඒ නිසා මේ ප්‍රශ්න ගැන කරන සටන යූඇන්පී ආණ්ඩුවක් සඳහා කරන සටනට කොහෙත්ම බද්ධ කරන්නට බෑ. මේක වඩාත් තදින් යූඇන්පී ආණ්ඩුවකටත් විරුද්ධ සටනක්.

අද මේ විදියට මේ ධනපති නායකයො දෙගොල්ලන්ටම විරුද්ධව යන ප්‍රබල සටනක් දෙසටයි වැඩ කරන ජනතාව හිත යොමු කළ යුත්තේ.